**සිංහල භාෂාව හා සාහිත්‍යය තරග 2024(කලාප)**

අපේක්ෂකයාගේ නම- ------------------------------------------------------------------------------------------
(මුලකුරු සමග නම)

පාසලේ නම හා ලිපිනය- ------------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------------

පාසල් වර්ගය- 200 ට අඩු / 201-500 / 501 ට වැඩි

කොට්ඨාසය- ------------------------------------------------------------------------------------------------

කලාපය- ---------------------------------------------------------------------------------------------------

සාහිත්‍ය දැනුම මිනුම

11 ශ්‍රේණිය කාලය පැය 03 (මුළු ලකුණු 100)

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) පහත දී ඇති ප්‍රකාශ ඇසුරෙන් (අ) කීවේ කවුරුන් විසින් ද? (ආ) කීවේ කා හට ද? (ඉ) කුමන අවස්ථාවේදී ද? (ඊ) උපුටා ගත් පාඩමෙහි නම කුමක් ද ? යන ප්‍රශ්නවලට පිළිවෙලින් පිළිතුරු දක්වන්න.

I "**පුත,මේ යුක්තිය සලකා පියා කියව...**"

II "**මිනිහා අනුමානයක් නෑ මැරෙන්ඩ ඇති**"

III "ගොසින් මම මේ වග සියල්ල මැණියන්ගෙන් අසා සොඳින් දැන ගන්නෙමි! "

IV "සොඳුර මම් යන්ට නොනිස්සෙමි.සතර දෙනෙකු කෙරෙහි විස්වස් නැති. "

V "අනික් කාට කියම්ද?තොප ම කොට ඇවිදිනා **කටයුතු හෙයින් තොප ම අරහයා කියමි.**"

**(ලකුණු 2x5 =10යි)**

**(02) පහත දැක්වෙන පද්‍ය සම්පූර්ණ කරන්න.**

I වර වෙණ නද අසමින් සිත සතොසිනි

II වරද පෙනෙන තරමට වැරදුණා නොවේ

III මිතුරු කමින් පෙරට එතොත්

IV හිරිමල් සිනා රැළි පෙණ පිඬු මිහිරිතම

V පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට

**(ලකුණු 4x5 = 20යි)**

(03) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I ටිබෙට් ජාතික ඇස් මහින්ද හිමියන් විසින් රචිත මුල් ම කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

II සතරකන් මන්ත්‍රණය පාඩමට පාදක වූ ජාතක කතාව කුමක්ද?

III සිංහලයේ ෂෙලී ලෙස හඳුන්වන කවියා අයත් කවි යුගය කුමක් ද?

IV පරමත්ථ ජෝතිකාව කෘතිය ලියවුණේ කිනම් යුගයක ද?

V ගුත්තිල කාව්‍යයේ කතුවරයා කවුද?

**(ලකුණු 2x05 = 10යි)**

**(04)පහත දැක්වෙන පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**ඔබා දෙදණ නිල් උඳුපියළි බිම මත**
**වැන්දේය ඔහු බැති සිතින්**
**අම්මා වැළලූ තැන මහ පොළවට**
**පිපිලා තිබුණි එතන සුදු පාටට**
**නමක් නොමැති පුංචි මලක්**
**සිම්බේ ය ඔහු එ මල නමා හිස**

**දස මසක් කුස තුළෙහි දරා සිට**
**මා ලොවට වැදූ අම්මා ඔබ ය**
**කෙළවරක් නොමැති දුක් දරා විඳ**
**මා ලොවට හැදූ අම්මා ඔබය**

**අඬන විට මා කුඩා අවදියෙහි බඩගිනි ව**
**තම්බා බතල දළු**
**ලුණු දියර ඉස**
**පොල් හා මුසු කොට කවා**
**බඩගිනි නිවූ අම්මා ඔබ ය**

**උයා උදයෙන් නැගිට කඩයප්පන්**
**තබා තේ කඩයෙහි**
**ලබා ඉන් ලැබෙන සුළු වට්ටම**
**ජංගි ඇන්දූ අම්මා ඔබ ය**

I කවි පන්තියෙන් කියවෙන්නේ කුමක් ගැන ද?------------------------------------------------------------------

II කවි පන්තියේ සඳහන් මවට කුමක් සිදු වී ඇත් ද?---------------------------------------------------------

III කවියා දක්වන මවගේ ගුණ මොනවාද?-------------------------------------------------------

IV කවියා කුඩා කළ ඉතා දුක්ඛිත දිවියක් ගත කළ බව හැගවෙන කවි පද මොනවාද?-----------------

V කවියා මව මෙන් සිතා ආමන්ත්‍රණය කරන්නේ කා හට ද?

**(ලකුණු 2x5 = 10යි)**

(05) පහත සඳහන් ගද්‍ය /පද්‍ය පාඨ ලිහිල් බසින් ලියන්න.

I සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සදැස් සවන් නොකළැ යි වූ නොසතුට

II 'හෙ හැම අරණ්‍යයෙහි හසර නැති කෙළෙ.දර පළා සඳහා වල් යන්නාහු නැති .රෑ ගමට වැදැ පයින් පැහැරැ දොර ගලවා පියා එහි හොතුවන් මරා පියා එකෙකැ දෙකෙකැයි ගැණැගෙන යෙයි '

**(ලකුණු 5x2 = 10යි)**

(06) පහත දැක්වෙන පාඨවල උපමා උපමේය වෙන් කොට ලියන්න.

Iසාල්ලෙක ලාලා පාතට බානා කෙනෙකුන් මෙන්,

II ශක්‍ර පුරයට වන් අසුර භටයන් පරිද්දෙන්

III ගජ සෙන් සිතියම් ගජ සිරි කියෙලී

IV දිසි මෙන් විය විදුලිය සිය දහසී

Vපුංචි මැණිකා මුවැත්තියක් වාගෙයි

**(ලකුණු 2x5 = 10යි)**

**(07)බැද්දේගම ක්‍රම ක්‍රමයෙන් අභාවයට යන ආකාරය සජීවී ලෙස නිරූපණය කිරීමට නවකතාකරුවා දක්වා ඇති සමත්කම නිදසුන් තුනක්වත් ඇසුරෙන් විමසන්න.**

**(ලකුණු 15)**

**(08)වැත්තෑවේ හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය කාව්‍යාලංකාර භාවිතය තුළින් මැනවින් ප්‍රකට වේ.නිදසුන් 03 ඇසුරින් විචාරයට ලක් කරන්න.**

**(ලකුණු 15)**